# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 243/59— 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### (40 වැනි අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

#### හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග

හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග යටතේ නියම බලධරයා වූ ධර්මසේන විජේසිංහ වන මම—

(අ) යථෝක්ත නියෝග මාලාවේ අංක 2 දරන නියෝගය යටතේ පහත සඳහන් කරුණු එම නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයට අදාළ කොන්දේසි වශයෙන් ද, එනම් :

(1) බලපත්‍රය අත්හිටවන හෝ අවලංගු කරන තෙක් බලපැවැත්විය යුතු ය.

(2) වෙනයම් නීතියක්, අතුරු නීතියක්, ව්‍යවස්ථාවක් හෝ නියෝගයක් යටතේ ලබා ගැනීමට නියමිත වෙන යම් බලපත්‍රයක් ලබා ගැනීමෙන් බලපත්‍රලාභී මේ බලපත්‍රයෙන් නිදහස් කරනු නොලැබේ.

(3) මේ බලපත්‍රය අන්සතු කළ නොහැකි ය.

(4) බලපත්‍රලාභීන්ගේ ව්‍යාපාර ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක මේ බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.

(5) බලපත්‍රලාභී විසින් හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග මාලාවේ සියළුම නියමයන් ද, මෙම කොන්දේසි සහ නියම බලධාරියා විසින් පනවනු ලබන වෙනත් කොන්දේසි වුවහොත් ඒවා ද අනුව ක්‍රියා කළ යුතු ය.

(ආ) යථෝක්ත නියෝග මාලාවේ අංක 3 දරන නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අය කළ යුතු ගාස්තුව—

(i) එබඳු බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ දිනට මාසයක් ඇතුළත ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයකු සඳහා රුපියල් එකක් (රු. 1/-), සහ

(ii) අනෙක් සියළුම පුද්ගලයින් සඳහා රුපියල් පහක් (රු. 5/-) වශයෙන් ද,

(ඇ) යථෝක්ත නියෝග මාලාවේ අංක 16 දරන නියෝගය යටතේ මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ජන ජීවිතයට අවශ්‍ය භාණ්ඩ ද,

මෙයින් නියම කරමි.

ඩී. විජේසිංහ,<br>
නියම බලධාරී,<br>
හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග.

වෙළෙඳ අමාත්‍යාංශය,<br>
යූනියන් පෙදෙස,<br>
කොළඹ 2,<br>
1976 දෙසැම්බර් 17.

#### උපලේඛනය

ගිනිපෙට්ටි<br>
අභ්‍යාස පොත්<br>
මොනිටර් අභ්‍යාස පොත්<br>
ගණිතමය කවකටු පෙට්ටි<br>
පැන්සල්<br>
ගල්ලෑලි

133A——ජ 24426—2,100 (76/12)

උපලේඛනය—(සම්බන්ධිතයි)

ගල්කුරු
කමිස
කපුරෙදි
කෘත්‍රිම රෙදි
බයිසිකල්
බයිසිකල් ටයර් සහ ටියුබ්
මෝටර් රථ හා ට්‍රැක්ටර් අමතර කොටස්
මෝටර් රථ හා ට්‍රැක්ටර් ටයර් හා ටියුබ්
බෙහෙත් ද්‍රව්‍ය (ආයුර්වේද බෙහෙත් වර්ග හැර)
දන්තාලේප
ටෝච් බැටරි
ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර බැටරි
කටු කම්බි
කෘෂිකාර්මික පොහොර
මහන යන්ත්‍ර
බයිසිකල් අමතර කොටස්
භූමිතෙල්
ගොඩනැගිලි ද්‍රව්‍ය
ට්‍රැක්ටර් හා ට්‍රැක්ටර් අමතර කොටස්
කෘෂිකාර්මික උපකරණ
රසායන කෘමි නාශක බෙහෙත්
විදුලි බුබුළු
සබන්
සපත්තු
සූට් කේස් හා වෙනත් සම් භාණ්ඩ
පෑන්
විදුලිමය උපකරණ
වැල්කම් පුයර
ඇළුමිනියම් භාණ්ඩ
බෙලෙක් භාණ්ඩ
ප්ලාස්ටික් භාණ්ඩ
දත් බුරුසු
පිරිසිදු කිරීම සඳහා ගන්නා රසායන ද්‍රව්‍ය
රෙදි සේදීම සඳහා ගන්නා නිල් සහ වෙනත් රසායන ද්‍රව්‍ය
ලියන තීන්ත
මහන නූල්
පෙනේර හා පෙරණයන්
විෂබීජ නාශක ද්‍රව්‍ය
යතුරු කටු
මේස රෙදි
කම්බි සහ කම්බි ඇණ
පිහි
වීදුරු හා පිඟන් බඩු
පිත්තල හැඳි
කුඩ
ලාම්පු
මැන්ටල්
පොලිෂ් වර්ග
ඇස්බැස්ටොස් තහඩු
ළදරු කිරි බෝතල්
සිමෙන්ති
වීදුරු තහඩු
මිශ්‍ර කරන ලද තීන්ත
තේ පෙට්ටි සහ තේ පෙට්ටි ආම්පන්න

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී